පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 212

ආයතනයේ නම : ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 120 (4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 212

நிறுவனத்தின் பெயர் : தேசிய இரத்தினக்கல், ஆபரண அதிகாரசபை

பாராளுமன்றத்தின் அரசாங்கப் பொறுப்பு முயற்சிகள் பற்றிய குழுவால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 120 (4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புகள் மற்றும் அது தொடர்பாக எடுக்கப்பட்ட நடவடிக்கைகள் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series No : 212

Name of the Institution : National Gem And Jewellery Authority

Submission of observations of the Hon. Minister In charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Enterprises in terms of Standing Order No. 120 (4).

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 120(4) යටතේ නිරීක්ෂණ හා ගනු ලැබූ ක්‍රියාමාර්ග පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 212

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

| අනු අංකය | ප්‍රකාශන මාලා 212 නිර්දේශ අංකය | කමිටු නිර්දේශය | අමාත්‍යාංශය / ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගය සහ වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | 01 | අධිකාරියේ සංයුතිය<br>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට:<br><br>I. මැණික් වෙළඳ බැංකුව නමින් ආයතනයක් නොපවතින බැවින් 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත සංශෝධනයේ දී ඒ පිළිබඳව අවධානය යොමු කිරීම.<br><br>II. මේ වන විට මැණික් වෙළඳ බැංකුව ලෙස ආයතනයක් පැවතීමේ අවශ්‍යතාවක් පවතීද යන්න සම්බන්ධව කරුණු සලකා බැලීම. | රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචන වාර්තාව ඉදිරිපත් කිරීම මැයෙන් වන අංක අමප/25/0288/802/005 සහ 2025 මාර්තු 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ආයතන ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය තුළ සිදුකිරීමට නියමිත පනත් සංශෝධනයේදී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට අදාළව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති නිර්දේශයන් කෙරෙහි ද අවධානය යොමු කරමින් පනත සංශෝධනය කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස අදාළ නිළධාරීන් වෙත 2025.07.14 දිනැතිව දැනුම් දී ඇත. (ඇමුණුම 01)<br>ඉහත පරිදි කටයුතු කරන බව 2025.07.14 දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත වාර්තා කර ඇත. (ඇමුණුම 02) |
| | | III. රේගු දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජනය අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම කඩිනම් කිරීම | ශ්‍රී ලංකා මහ බැංකු ව නියෝජනය කරමින් 2025.03.07 දිනැතිව ඊ. එච්. මොහොට්ටි මහත්මිය ද, රේගු දෙපාර්තුමේන්තුව නියෝජනය කරමින් 2025.03.20 දිනැතිව ඒ. ඩබ්. එස්. අයි. සිල්වා මහතා ද අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. (ඇමුණුම 03 හා 04) |

| | | | |
|---|---|---|---|
| | | **IV. මෙම නිර්දේශ මාසයක් තුළ (2025.04.05 දිනට පෙර) ක්‍රියාත්මක කර ඒ පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.** | **ඉහත පරිදි කටයුතු කල බව 2025.07.21 දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත වාර්තා කර ඇත. (ඇමුණුම 05)** |
| **02** | **02** | **<u>උපාය මාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම ගණන්දීමේ නිලධාරියාට:</u>**<br><br>**I. ලංකාවේ නව ජාතික ප්‍රතිපත්ති හා පවතින ආර්ථික, සාමාජීය අවශ්‍යතා සහ අනාගතයේ ඇතිවිය හැකි අවශ්‍යතාවලට ගැලපෙන යාවත්කාලීන සංයුක්ත සැලැස්මක්, උපාය මාර්ගික සැලැස්මක් සහ ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරීම.**<br>**II. එහිදී මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය, ප්‍රවර්ධනය සහ නියාමනය යන සියලුම ක්ෂේත්‍රවලට අදාළ කරුණු පිළිබඳව දැඩිව අවධානය යොමු කිරීම.**<br>**III. මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට නව තාක්ෂණය රැගෙන ඒමට අවධානය යොමු කිරීම.**<br>**IV. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට සංයුක්ත සැලැස්මක්, උපාය මාර්ගික සැලැස්මක් සහ ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරීමේ දී ආයතනය තුළින්ම අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කර සකස් කිරීමට කටයුතු කිරීම.**<br>**V. මේ පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.** | **2025 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට ඇත. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2025.01.30 දිනැති මාණ්ඩලික පත්‍රිකා අංක 2572 මගින් ලබා ගෙන ඇත. (ඇමුණුම් අංක 06)**<br>**අධිකාරියේ 2025-2029 වර්ෂවලට අදාළ නව සංයුක්ත සැලැස්ම ජාතික ප්‍රතිපත්ති හා පවතින ආර්ථික සමාජීය අවශ්‍යතා සහ අනාගතයේ ඇති විය හැකි අවශ්‍යතා වලට ගැලපෙන පරිදි යාවත්කාලීනවද , මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය ප්‍රවර්ධනය හා නියාමනය යන කරුණු මූලික කොට ගනිමින් ද, මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයන්හි වර්තමානයේ පවතින ගැටලු සඳහා අවශ්‍ය සාධනීය පිළිතුරු ළඟාකර ගත හැකි වන පරිදි සකසා ඇත. එසේම මෙම නව සංයුක්ත සැලැස්ම මඟින් මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා සහ අධිකාරියෙන් ලබා දෙන සේවාවන් සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම සඳහාද කටයුතු කර ඇත. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ, අධිකාරියේ ඉහල කළමණාකාරීත්වය සහ සියළුම අංශ ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් දෙදිනක වැඩමුළුවක් පවත්වා මූලික කෙටුම්පත සකස් කරනු ලැබූ අතර ඉන්පසු පැවැත්වූ සාකච්ඡා වාර ගණනාවක් අවසානයේ අවසන් කෙටුම්පත නිම කොට ඇත. මෙසේ සකස් කර ඇති සංයුක්ත සැලැස්ම (2025-2029) ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කර එකී අනුමැතිය ලබා ගැනීමෙන් පසු විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට නියමිත වේ.** |

| | | | |
|---|---|---|---|
| 03 | 03 | <u>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම</u><br><u>ගණන්දීමේ නිලධාරියාට:</u><br><br>I. අවමය මසකට එක් වරක් ලෙස සහ අවශ්‍යතාවය අනුව උපරිම වාර ගණනක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම.<br><br>II. වසර අවසානයේ දී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම. | 2025 වර්ෂය තුල මේ දක්වා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 07 ක් පැවැත්වීමට කටයුතු කර ඇත. සමස්ථ වාර්තාව වසර අවසානයේ විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට නියමිත වේ. |
| 04 | 04 | <u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්</u><br><u>ගණන්දීමේ නිලධාරියාට:</u><br><br>I. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවමය කාර්තුවකට එක් වරක් ලෙස සහ අවශ්‍යතාවය අනුව උපරිම වාර ගණනක් රැස්වීම.<br><br>II. වසර අවසානයේ පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම. | පලමු කාර්තුවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2025.04.03 වන දින සහ දෙවන කාර්තුවේ විගණන කමිටු රැස්වීම 2025.07.14 දින පවත්වා ඇත. සමස්ථ වාර්තාව වසර අවසානයේ විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට නියමිත වේ. |

| | | | |
|---|---|---|---|
| **05** | **05** | <u>කාර්ය මණ්ඩලය</u><br><u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට:</u><br><br>**I.** ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නීති අංශයේ පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම. | නීති අංශයේ තනතුරු පුරප්පාඩු **04** ට අමතරව තවත් තනතුරු පුරප්පාඩු **19** ක් සඳහා බඳවාගැනීම් සිදු කිරීමට අදාල රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීමේ කමිටු අනුමැතිය ලබා ගැනීම සඳහා **2025.03.12** දිනැතිව ලිපියක් රේඛිය අමාත්‍යාංශය මගින් උක්ත කමිටුව වෙත යොමු කර ඇත. (ඇමුණුම **07**) ඊට අදාල සාකච්ඡාවක් **2025 .06.18** දින අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේදී පැවැත්විය. ඉහත අනුමැතීන් ලබා ගන්නා තුරු ආයතනයේ කටයුතු ප්‍රමාදයයකින් තොරව පවත්වා ගෙන යාම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ **1/2020** අනුව කාර්ය පැවරුම් පදනම මත නීති නිලධාරීන් **04** දෙනෙකුගේ සේවය ලබා ගන්නා ලදී.<br>(ඇමුණුම **08**) |
| | | **II.** රාජ්‍ය ව්‍යාපාර ඒකාබද්ධ කිරීම යටතේ මෙම ආයතනය වෙනත් ආයතන සමඟ ඒකාබද්ධ කළද තවදුරටත් අත්‍යවශ්‍ය වන තනතුරු හඳුනාගෙන එම තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. | රාජ්‍ය ව්‍යාපාර ඒකාබද්ධ කිරීම යටතේ මෙම මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය සමඟ ඒකාබද්ධ කිරීමේ කටයුතු සඳහා අතිරේක ලේකම් (සාම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධන) ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කර ඇත. (ඇමුණුම් **09**) එම කමිටුවේ නිර්දේශ පදනම් කොට මෙම ආයතන දෙක ඒකාබද්ධ වීමේදී අත්‍යාවශ්‍ය තනතුරු හඳුනාගැනීම සහ එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත. |
| | | **III.** අදාළ නිලධාරීන් අදාළ තනතුරුවල රාජකාරී කටයුතුවල යෙදවීම හා එම කටයුතු මනාව සිදුවන්නේ ද යන්න අධීක්ෂණය කිරීම. | අදාළ නිළධාරීන් වෙත රාජකාරී ලැයිස්තු ලබාදී ඇති අතර, අදාල රාජකාරී ලැයිස්තුවලට අනුකූලව රාජකාරී කටයුතු ඉටුකර තිබේද යන්න වාර්ෂිකව සමාලෝචනය කිරීම සිදුකිරීම සඳහා සකසන ලද කාර්ය සාධන ඇගයීමේ ක්‍රමවේදයක් මගින් අධීක්ෂණය කරනු ලැබේ. |
| | | **IV.** මේ පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම. | මේ සම්බන්ධයෙන් අදාල වාර්තාව **2025.07.23** දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත. (ඇමුණුම **10**) |

| | | | |
|---|---|---|---|
| **06** | **06** | <u>පනත සංශෝධනය කිරීම</u><br><u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට:</u><br><br>**I.** රාජ්‍ය ව්‍යාපාර ඒකාබද්ධකරණය කිරීම පිළිබඳ අවසන් තීරණය අනුව **1993** අංක **50** දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනතට සිදු කළ යුතු සංශෝධන හඳුනා ගැනීමට කටයුතු කිරීම.<br><br>**II.** ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් ලෙස තනතුරු **02**ක් ඇති කිරීමට හැකි වන සේ **1993** අංක **50** දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනතේ **8 (6)** වන වගන්තිය සංශෝධනය කිරීම.<br><br>**III.** මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය, ප්‍රවර්ධනය සහ නියාමනය තුළින් කර්මාන්තයේ විශිෂ්ඨත්වය ළඟා කර ගැනීම සඳහා සහ සියලුම ආකාරයේ පරිසර හානි වැළැක්වීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ ඒකාබද්ධව කටයුතු කළ යුතු (භූ විද්‍යා හා පතල් කැණීම්, වන ජීවි, වන සංරක්ෂණ, පානීය ජල කළමනාකරණ ආයතන, මධ්‍යම පරිසර අධිකාරිය, කෘෂිකර්මාන්ත, ……. වැනි) සියලුම ආයතන හඳුනා ගැනීම සහ එම අංශවල නියෝජනයක් සහිත අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් පත් කර | රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචන වාර්තාව ඉදිරිපත් කිරීම මැයෙන් වන අංක අමප/**25/0288/802/005** සහ **2025** මාර්තු **25** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ආයතන ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය තුළ සිදුකිරීමට නියමිත පනත් සංශෝධනයේදී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට අදාළව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති නිර්දේශයන් කෙරෙහි ද අවධානය යොමු කරමින් පනත සංශෝධන කිරීටම අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස අදාළ නිළධාරීන් වෙත **2025.07.14** දිනැතිව දැනුම් දී ඇත. (ඇමුණුම **01**)<br><br>ඉහත පරිදි කටයුතු කරන බව **2025.07.14** දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත වාර්තා කර ඇත. (ඇමුණුම **02**) |

| | | | |
|---|---|---|---|
| | | ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ඇතුළත් කිරීමට 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත සංශෝධනයේදී අවශ්‍ය කටයුතු සිදු කිරීම.<br><br>IV. 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත පිළිබඳව සියලුම නිලධාරීන්ට පෘථුල දැනුමක් ලබා දීම සහ දැනුවත් වූ බවට අදාළ තොරතුරු අධිකාරිය සතුව පවත්වා ගැනීම. | <br><br><br>පනත පිළිබඳව ආයතනයේ සියලු අංශවල නිලධාරීන් දැනුවත් කිරීමේ සහ අදහස් හා යෝජනා ලබාගැනීමේ සාකච්ඡාවක් 2025.03.11 සහ 2025.03.19 දින පවත්වන ලදී. |
| 07 | 07 | <u>මැණික් කර්මාන්තයේ නියාමනය සහ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය</u><br><u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට;</u><br><br>I. මීපාගම පිහිටි කැබැල්ල ගහෝවිට නැමැති ඉඩම සම්බන්ධව ඉදිරිපත් කර තිබූ මැණික් ගැරීම සඳහා බලපත්‍ර අයදුම්පත නිකුත් කිරීම සම්බන්ධ අමාත්‍යාංශය සතු අභියාචනා බලය ක්‍රියාත්මක කිරීමේ දී එකී බලපත්‍රය ලබා දීම ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු අභියාචනා කමිටුවේදී නිසි පරිදි සලකා බැලුවේද, එම කරුණු නිශේධනය නොවී බලපත්‍ර ලබාදුන්නේ ද යන්න පිළිබඳ වාර්තාවක් සති 02 තුළ (2025.03.19 දිනට පෙර) විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම. | <br><br><br><br>අදාල වාර්තාව 2025.03.18 දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත. (ඇමුණුම 11) |

| | | | |
|---|---|---|---|
| | | **II.** ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් බලපත්‍ර ලබා දීම, බලපත්‍ර කාලය දීර්ඝ කිරීම, ප්‍රතික්ෂේප කිරීමෙන් පසු අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුතු අභියාචනා කමිටුව විසින් අනුමැතිය ලබා දීම් සිදු කර තිබේ නම් ඒ පිළිබඳ වාර්තාවක් සති **02** තුළ **(2025.03.19** දිනට පෙර) විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.<br><br><u>ගණන්දීමේ නිලධාරියාට:</u><br><br>**III.** බලපත්‍ර ඉල්ලීම් සඳහා විරෝධතා ප්‍රකාශ කිරීමට අදාළ දැන්වීම් නිසි කාල සීමාව තුළ අදාළ ග්‍රාම නිලධාරී කාර්යාලවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සහ නිසි පරිදි සිදු වන්නේ ද යන්න අධීක්ෂණය කිරීම. | බලපත්‍ර නිකුත් කිරීමට අදාලව දැන්වීම් පලකිරීම හා ප්‍රසිද්ධ කිරීම බලපත්‍ර ලබා දෙන ඉඩමට අමතරව ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහ ඉඩම පිහිටි ග්‍රාම නිලධාරී කාර්යාලය තුල ප්‍රදර්ශනය කිරීමට සියළුම ප්‍රාදේශීය කළමණාකරුවන් වෙත ලිඛිතව උපදෙස් ලබාදීමට **2025.03.18** දිනැතිව කටයුතු කර ඇති අතර මේ වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලද මෙම දැන්වීම් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර ඇත. |
| **08** | **08** | <u>මැණික් ආනයන හා ප්‍රති අපනයන</u><br><u>ගණන්දීමේ නිලධාරියාට;</u><br><br>**I.** ශ්‍රී ලංකා රේගුව හරහා **2022, 2023** සහ **2024** වර්ෂ තුන තුළ එකතුව **46,815.94 kg** ක් වූ රු.**2,091,693,980** ක් වටිනා මැණික් ආනයන සිදු කර තිබීම, මෙම ආනයන තුළින් සමාජ ආරක්ෂණ බද්ද රු.**15,614,849** ක් ද එකතු කළ අගය මත බදු රු.**38,616,009 (2024** දී) අය වී තිබීම, මෙම වසර තුන තුළ දී වටිනාකම | ශ්‍රී ලංකා රේගුවේ දත්ත අනුව ආනයනය කරන ලද මැණික් පාෂාණ කිලෝග්‍රෑම් **46,815.94** ක ප්‍රමාණය අතුරෙන් **2023** වර්ෂයේ දී ඉතාම පහළ තත්වයේ රබහ වර්ගයේ රළු මැණික් කිලෝග්‍රෑම් **7,500** ක් සහ **2024** වර්ෂයේ දී කිලෝග්‍රෑම් **22,000** ක් වශයෙන් ආනයනය කර ඇති බව අනාවරණය විණි. මෙම අසාමන්‍ය මැණික් ආනයන ප්‍රමාණයන් පිළිබඳ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් ආනයනකරුවන්ගෙන් ප්‍රකාශ ලබා ගන්නා ලද අතර මෙම රළු මැණික් ඉතාම පහළ තත්ත්වයේ රබහ මැණික් බව මේ පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණයේ නියැලුණු ක්‍රියාත්මක නිලධාරීන් විසින් භෞතිකව නිරීක්ෂණය කොට වාර්තා කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | | රු.22,523,409 ක් වූ මැණික් 1,664.06 kgක් පමණක් රු.10,723,623 ක අගයක් එකතු කර අධිකාරිය හරහා නැවත ප්‍රති අපනයනය කිරීම සම්බන්ධව වාර්තාවක් මාස 01 තුළ (2025.04.05 දිනට පෙර) විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.<br><br>II. මැණික් ආනයනය කිරීමේ දී සහ ප්‍රති අපනයනය කිරීමේ දී අධිකාරිය නිසි නියාමනයක් සිදු නොකිරීම හේතුවෙන් ආනයනික මැණික් වටිනාකම මත අය වන බදු ගණනය කිරීම හා අපනයනික මැණික් ගල්වල වටිනාකම සහ ඒ මත අයවිය යුතු බදු අය කර ගැනීම පිළිබඳව සලකා බැලීම. | මේ සම්බන්ධයෙන් අදාල වාර්තාව 2025.07.23 දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත. (ඇමුණුම 12)<br><br>1993 අංක 50 දරණ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරි පනතේ 16 වගන්තිය මගින් සියළු මැණික් අපනයනය ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ අනුමැතියෙන් සිදු විය යුතු බව දක්වා ඇත.<br>එහෙත් මැණික් ආනයනය සම්බන්ධයෙන් පනතේ නිශ්චිත ප්‍රතිපාදන සලසා නොමැති බැවින් ඉදිරි පනත් සංශෝධන ක්‍රියාවලිය තුළ මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට අපේක්ෂිතය.<br><br>එතෙක් කාරක සභා නිර්දේශ අනුව එම ක්‍රියාවලිය නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකා රේගු දෙපාර්තුමේන්තුව සමඟ 2025.05.30 දිනැතිව අවබෝධතා ගිවිසුමකට එළෙඹන ලදී. (ඇමුණුම 13)<br><br>මීට අමතරව 2025. 03.10 දිනැති ලිපිය මඟින් මැණික් ආනයනය කිරීමේදී අධිකාරිය විසින් නිකුත් කරන ලද වලංගු වෙළෙඳ බලපත්‍රයක් ආනයනකරු වෙත පවතින්නේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රේගු දෙපාර්තුමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කර ඇත. (ඇමුණුම 14) |
| 09 | 09 | <u>මැණික් අපනයනයේදී අයකරන රු. 3500 ක ගාස්තුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට;</u><br><br>I. මේ සම්බන්ධයෙන් කරුණු සොයාබලා විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට වාර්තාවක් මාස 01 තුළ (2025.04.05 දිනට පෙර) ඉදිරිපත් කිරීම. | මේ සම්බන්ධයෙන් අදාල වාර්තාව 2025.07.23 දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත. (ඇමුණුම 15) |

| | | | |
|---|---|---|---|
| **10** | **10** | <u>මැණික් ආනයනය</u><br><u>ගණන්දීමේ නිලධාරියාට;</u><br><br>**I.** මැණික් ආනයනය කිරීමේ දී නියාමනයක් සිදු කිරීමට නිසි ක්‍රමවේදයක් සකස් කර අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හා ඒ සම්බන්ධයෙන් වාර්තාවක් මාස **01** තුළ **(2025.04.05** දිනට පෙර) විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම. | ශ්‍රී ලංකා රේගු දෙපාර්තුමේන්තුව සමඟ **2025.05.30** දිනැතිව ඇති කර ගන්නා ලද අවබෝධතා ගිවිසුම මඟින් මැණික් ආනයනයන්ට අදාලව තොරතුරු ලබාගැනීමට කටයුතු කර ඇත. ( ඇමුණුම **13)**<br><br>මීට අමතරව **2025. 03.10** දිනැති ලිපිය මඟින් මැණික් ආනයනය කිරීමේදී අධිකාරිය විසින් නිකුත් කරන ලද වලංගු වෙළෙඳ බලපත්‍රයක් ආනයනකරු වෙත පවතින්නේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රේගු දෙපාර්තුමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කර ඇත. (ඇමුණුම **14)**<br><br>මෙ සම්බන්ධයෙන් අදාල වාර්තාව **2025.07.23** දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත. (ඇමුණුම **16)** |
| **11** | **11** | <u>රත්‍රන් ආනයනය</u><br><u>ගණන්දීමේ නිලධාරියාට;</u><br><br>**I.** රත්‍රන් ආනයනය කිරීම ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නියාමනයට අදාළ වීම/නොවීම සහ ඒ වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධව වාර්තාවක් මාස **01** තුළ **(2025.04.05** දිනට පෙර) විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම. | **1993** අංක **50** දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනත අනුව අමුද්‍රව්‍යයක් ලෙස රත්‍රන් ආනයන හෝ අපනයනය අධිකාරියේ කාර්යභාරයට ඇතුළත් නොවේ.<br>ශ්‍රී ලංකාවට රත්‍රන් ආනයනය කිරීමට අනුමැතිය ලබාදෙන්නේ ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා නිකුත් කරන ලද **2021.06.11** දිනැති අංක **2023/16** ගැසට් අංකය මඟිනි.<br><br>මෙ සම්බන්ධයෙන් අදාල වාර්තාව **2025.07.23** දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත. (ඇමුණුම **17)** |

| | | | |
|---|---|---|---|
| 12 | 13 | <u>මැණික් ගැරීම් බලපත්‍ර ප්‍රමාණය සහ ඉන් ලබන ආදායම</u><br><u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට;</u><br>**I.** මෙම මැණික් මල්ල නිදහස් කිරිම සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණ කමිටුවක් පත් කර පරීක්ෂණයක් සිදු කර වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර විගණකාධිපතිවරයාට පිටපත් සහිතව මාස 01 ක් තුළ (2025.04.05 දිනට පෙර) කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම. | ශාහුල් හමීඩ් මොහොමඩ් නිසාම් යන අය පවත්වාගෙන යනු ලබන Elegnat Gems ආයතනය විසින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙතින් අපනයනයට අපේක්ෂිත පාෂාණ වලට අදාලව තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට ඉදිරිපත් කර ඇති ඉන්වොයිස් පත්‍රිකාවල අපනයනයට අඩු වටිනාකමක් දක්වා ඉදිරිපත් කිරීමේ වංචාවට අදාල නඩු විභාගයෙන් පසු, එම මැණික් පාර්සලය මුදාහැරීම පිළිබඳව ගැටළුවට අදාලව පරීක්ෂණ සිදු කිරීම සඳහා 2025.03.12 දිනැතිව සාමාජිකයන් 05 දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත් කරන ලදී. ( ඇමුණුම 18)<br><br>අදාල කමිටු වාර්තාව 2025.06.30 දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත භාර දී ඇත. (ඇමුණුම 19)<br><br>එම කමිටු වාර්තාවේ නිර්දේශ ප්‍රකාරව අවශ්‍ය නිතීමය සහ පරිපාලනමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ආයතනය වෙත 2025.06.30 දිනැතිව උපදෙස් ලබා දී ඇත. (ඇමුණුම 20)<br><br>අදාල වාර්තාවේ සඳහන් නීතීමය ක්‍රියාමාර්ග ගත යුතු නිර්දේශ සම්බන්ධයෙන් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් 2025.07.24 දිනැතිව I.B.Reference 01 අංක යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර ඇත. (ඇමුණුම 21)<br><br>එම වාර්තාවේ සඳහන් විනය හා පරිපාලන නිර්දේශ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ආයතනයේ මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට යොමු කර කටයුතු කිරීමට නියමිතය. |
| 13 | 14 | <u>මැණික් හා ස්වර්ණාභරණ අපනයනයෙන් ලැබෙන විදේශ ප්‍රේෂණ ප්‍රමාණය</u><br><u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට;</u><br>**I.** අපනයන අදායම නිසි පරිදි රටට ගෙන ඒම නියාමන ක්‍රමවේදය ක්‍රියාත්මක වීමේ දී | අපනයනකරුවන් සඳහාම වෙන්වූ විශේෂිත බලපත්‍රයක් නොමැති අතර දැනට මැණික් වෙළඳ බලපත්‍රය යොදාගනිමින් අපනයන කටයුතු සිදුකිරීමට අවශ්‍ය අනුමැතිය ලබා දෙනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | | අපනයනකරුවන්ගේ වාණිජ බැංකු සෘජුවම අධිකාරියට සත්‍ය ප්‍රේෂණ තොරතුරු ලබා නොදීම සහ සත්‍ය විකුණුම් වටිනාකම් අපනයන කරුවන්ගෙන් ලබා ගැනීමට අපහසු වීම වැළැක්වීමට අධිකාරියට පවතින බලය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම. | ඉදිරියේදී අපනයනනරුවන් සඳහා අපනයන බලපත්‍රයක් හඳුන්වාදීමට නියමිත අතර එම බලපත්‍රය වාර්ෂිකව අළුත් කිරීමේදී විදේශ විනිමය ප්‍රේෂණ ඉපයීම් හෙළිදරව් කළයුතු බවට කොන්දේසියක් පැනවීමට නියමිතය.<br><br>මේ සම්බන්ධයෙන් අදාල වාර්තාව 2025.07.23 දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත. (ඇමුණුම 22) |
| 14 | 16 | <u>පුහුණු නිලධාරීන්ගේ අවශ්‍යතාවය සහ පුහුණු වැඩසටහන්</u><br><u>ගණන්දීමේ නිලධාරියාට;</u><br><br>I. රසායනාගාරයේ සේවය කරන රත්න විද්‍යාඥයින් හට Fellowship of Gemological Association (FGA) Gemological Institute of America (GIA) වැනි ඩිප්ලෝමා හා විදේශ රසායානාගාරයක පුහුණුව ලබාදීමට කටයුතු කිරීම. | මැණික් රසායනාගාරයේ සේවය කරන රත්න විද්‍යාඥයින් 16 ක් අතුරින් දැනට හතර දෙනෙක් FGA උසස් ඩිප්ලෝමාව ලබාගෙන ඇත. තවත් නිළධාරීන් දෙදෙනෙක් FGA ඩිප්ලෝමාව හදාරමින් සිටියි. ඒ සඳහා 2025 අයවැයෙන් මිලියන 3 ක් වෙන් කර ඇත.<br><br>නිළධාරීන් පස්දෙනෙක් පරිවාස කාලයේ සිටි නිළධාරීන් බැවින් ඔවුන් පරිවාස කාලය අවසන් වීමෙන් පසුව FGA පාඨමාලාව සඳහා අධිකාරිය මඟින් මූල්‍ය අනුග්‍රහය ලබා දීමට කටයුතු කරනු ලැබේ. |
| 15 | 17 | <u>කිලෝ ග්‍රෑම් 510ක් බර "Rough Sapphire Cluster" මැණික් පාෂාණය</u><br><u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට;</u><br><br>I. මෙවැනි සිදුවීම් ඉදිරියේදී සිදු නොවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. | අපනයනය සඳහා ඉදිරිපත් කරනු ලබන මැණික් පොකුරු ස්පටික හෙවත් කෞතුකාගාර අයිතමයන් විවිධ නිර්ණායක මත තක්සේරු කිරීම වැලැක්වීම සඳහා මාර්ගෝපදේශයක් සකස් කර ඇත. ඒ අනුව ඉදිරික්‍රියා මාර්ග ගැනීමට නියමිතය. (ඇමුණුම 23) |

| | | | |
|---|---|---|---|
| **16** | **19** | <u>අධිකාරියේ රසායනාගාරය සතු **FTIR** යන්ත්‍ර දෙක අක්‍රිය වීම</u><br><u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට;</u> | |
| | | **I.** ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ රත්නපුර කාර්යාලයේ සවිකර ඇති **FTIR** යන්ත්‍රයෙහි කොටසක් නොමැතිවීම වීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් ස්වාධීන කමිටුවක් පත් කර නිසි විමර්ශනයක් සිදු කර වගකිව යුතු සියලුම නිලධාරීන් හඳුනා ගැනීම සහ අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සහ ඒ පිළිබඳ වාර්තාවක් මාස **01** ක් තුළ (**2025.04.05** දිනට පෙර) විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ රත්නපුර කාර්යාලයේ සවිකර ඇති **FTIR** යන්ත්‍රයෙහි කොටසක් නොමැතිවීම වීම සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීමට **2025.03.19** දිනැතිව කමිටු සාමාජිකයන් **03** දෙකුගෙන් යුතු කමිටුවක් පත් කරන ලදී. (ඇමුණුම **24**)<br><br>අදාල කමිටු වාර්තාව **2025.05.29** දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත භාර දී ඇත. (ඇමුණුම් **25**)<br><br>කමිටු වාර්තාවේ නිරීක්ෂණ හා නිර්දේශ ප්‍රකාරව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා **2025.05.28** දිනැතිව ආයතනය වෙත යොමු කර ඇත. (ඇමුණුම **26**)<br><br>අදාල කමිටු වාර්තාව මඟින් ලබාදුන් නිර්දේශ අනුව **FTIR** යන්ත්‍ර නිශ්කාර්යව තබා තිබීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්වයන් නිශ්චය කර ගැනීම සඳහා මූලික පරීක්ෂණයක් පැවැත්වීම සඳහා ස්වාධීන නිලධාරියකු පත් කර ඇත. (ඇමුණුම **27**) |
| | | **II.** අදාළ යන්ත්‍රය භාවිතයට ගත හැකි ලෙස සකස් කිරීම. | අදාළ යන්ත්‍රය මඟින් සහතික පත්‍ර ලබා දීම සඳහා යන්ත්‍රය සුසර කල යුතු බවට (**fine tune**) පරීක්ෂණ වාර්තාවේ දක්වා ඇති අතර ඒ සඳහා තාක්ෂණික නිර්දේශ ලැබී ඇත. ඒ අනුව මේ වන විට අදාළ තාක්ෂණික නිවැරිදි කිරීම් සිදු කර ඇති අතර තාක්ෂණික පුහුණුව ලබා දීමට කටයුතු කරමින් පවතී. (ඇමුණුම **28**) |

| | | | |
|---|---|---|---|
| 17 | 20 | මැණික් කර්මාන්තයේ නියාමනය සහ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය<br>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට: | |
| | | I. මෙම අභියාචනා බලය අමාත්‍යාංශ ලේකම් වෙත තවදුරටත් පවත්වා ගැනීමේ අවශ්‍යතාව පිළිබඳව පනත සංශෝධනයේදී නැවත සළකා බැලීම.<br><br>II. අදාළ කටයුතු සිදු කරන අවස්ථාවේ දී ඒ සම්බන්ධව වාර්තාවක් විගණකාධිපතිට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම. | රජයට අයත් වාණිජමය නොවන ආයතන පිලිබඳ සමාලෝචන වාර්තාව ඉදිරිපත් කිරීම මැයෙන් වන අංක අමප/25/0288/802/005 සහ 2025 මාර්තු 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ආයතනය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය තුළ සිදුකිරීමට නියමිත පනත් සංශෝධනයේදී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට අදාළව පොදු ව්‍යාපාර පිළිබ කාරක සභාව විසින් ලබා දී ඇති නිර්දේශයන් කෙරෙහි ද අවධානය යොමු කරමින් පනත සංශෝධන කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස අදාළ නිළධාරීන් වෙත 2025.07.14 දිනැතිව දැනුම් දී ඇත. (ඇමුණුම 01)<br>ඉහත පරිදි කටයුතු කරන බව 2025.07.14 දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත වාර්තා කර ඇත. (ඇමුණුම 02) |
| | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට: | |
| | | III. මැණික් ගැරීම් බලපත්‍ර නිකුත් කිරීම 100% ක් නිවැරදි කිරීමට සහ මහජන පෙත්සම්, විරෝධතා අවම කිරීමට අවශ්‍ය සියලු කටයුතු සිදු කිරීම හා ඒ පිළිබඳව වාර්තාවක් විගණකාධිපතිට පිටපත් සහිතව කාරක සභාවට මාස 01 ක් තුළ ඉදිරිපත් කිරීම. | මේ සම්බන්ධ සවිස්තරාත්මක වාර්තාවක් 2025.07.23 දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත. (ඇමුණුම 29) |
| | | IV. මේ සම්බන්ධයෙන් අවශ්‍ය සියලු විධිවිධාන 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත සංශෝධනයේදී අන්තර්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සහ අදාළ කටයුතු සිදු කරන අවස්ථාවේ දී ඒ පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම. | පනතේ අදාල සංශෝධන සිදු කරන අවස්ථාවේදී විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීමට නියමිතය. |

| | | | |
|---|---|---|---|
| **18** | **21** | <u>හෙරණියාවක මැණික් ඉල්ලම ඉවත් කර ගැනීම සඳහා වන ව්‍යාපෘතිය</u><br><u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට:</u> | |
| | | **I.** හෙරණියාවක මැණික් පතල් ව්‍යාපෘතියට ගිවිසුම්ගත වීම සහ ගිවිසුම් දීර්ඝ කිරීම අධිකාරියට පැවරී ඇති බලතල ප්‍රකාරව නිත්‍යානුකූලව සහ විධිමත්ව සිදු වී තිබේද යන්න සම්බන්ධව සියලු කරුණු සම්බන්ධයෙන් වාර්තාවක් මාස **01** තුළ විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම. | හෙරණියාවක මැණික් පතල් ව්‍යාපෘති ගිවිසුම සම්බන්ධ ගැටළුවට අදාල විමර්ශනය කිරීම සඳහා **2025.05.08** දිනැතිව සාමාජිකයින් **05** දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත් කරන ලදී. **(ඇමුණුම 30)**<br><br>කමිටු සභාපති විසින් විමර්ශනය සඳහා **2025.07.04** දිනැතිව මාස **02** ක අතිරේක කාලයක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම අනුව වාර්තාව ලබා දීමට **2025.09.04** දින දක්වා කාලය ලබා දී ඇත. **(ඇමුණුම 31)** |
| | | **II.** **2024.01.31** වන දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා **2426** මඟින් ලබා දී තිබූ අනුමැතිය අනුව අදාළ ගිවිසුම අත්සන් කිරීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට පැමිණෙන ලෙස **2024.04.08** වන දින අදාළ **Lotus International Trade (Pvt) Ltd** සමාගම වෙත දන්වා යැවීමෙන් අනතුරුව දීර්ඝ කාලයක් අදාළ ගිවිසුම අත්සන් නොකිරීම සම්බන්ධව අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කර ඒ සම්බන්ධයෙන් වගකිව යුතු සියලුම නිලධාරීන්ට සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීම සහ ඒ පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව මාස **01** තුළ කාරක සභාවට ඉදිරිපත් කිරීම | එම තොරතුරු **2025.07.14** දිනැතිව කාරක සභාව වෙත වාර්තා කර ඇත. **(ඇමුණුම 32)** |

| | | | |
|---|---|---|---|
| | | **III.** **මෙම ව්‍යාපෘතිය යටතේ සමෘද්ධි සමිති වෙත හිමි විය යුතු 25% ක ප්‍රතිලාභය වියදම් දරන පාර්ශවය වෙත/පුද්ගලික නමට චෙක්පත් නිකුත් කිරීමට අධිකාරිය විසින් කටයුතු කර තිබීම සම්බන්ධව පහත කරුණු ඇතුළත් වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව මාස 01 තුළ කාරක සභාවට ඉදිරිපත් කිරීම.**<br>**1.** මෙම ගෙවීම්වලට බලය දීම, නිර්දේශ කිරීම, වියදම සහතික කිරීම, අනුමත කිරීම ගෙවීම සිදු කරන ලද නිලධාරීන් සම්බන්ධ තොරතුරු,<br>**2.** මෙම ගෙවීම් සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිවරයාගේ අනුමැතිය පවතියේ ද යන්න,<br>**3.** මෙලෙස පුද්ගලික නම්වලට චෙක්පත් නිකුත් කිරීම මුදල් රෙගුලාසි උල්ලංඝනය කිරීමක් බවට විගණකාධිපති විසින් පෙන්වා දීමෙන් පසු ඒ වන විට පුද්ගලික නම්වලට නිකුත් කර තිබූ චෙක්පත් සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව,<br>**4.** අදාළ මුදල එම පෞද්ගලික නමින් චෙක්පත ලැබූ පුද්ගලයාගෙන් නිසි පරිදි අදාළ සමෘද්ධිලාභීන් වෙත ලැබුණු බව සහතික කර ගත්තේ ද යන්න සහ එය නැවත සහතික කිරීමට පරීක්ෂණයක් පැවැත්වීම සහ එහි වාර්තාව,<br>**5.** මෙවැනි වැරදි ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නැවත සිදු නොවීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව, | |

| | | | |
|---|---|---|---|
| | | **6.** මේ සම්බන්ධයෙන් අදාළ වරද සිදු කරන ලද නිලධාරීන්ට එරෙහිව ගනු ලැබූ සහ ඉදිරියේ දී ගැනීමට නියමිත ක්‍රියාමාර්ග පිළිබඳව,<br>**7.** මේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි හා සිදු වූ සියලු දූෂණ අක්‍රමිකතා සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කිරීම.<br><br><u>ගණන්දීමේ නිලධාරියාට:</u> | |
| | | **IV.** හෙරණියාවක මැණික් පතලේ වර්තමාන කටයුතු සම්බන්ධයෙන් කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කිරීම සහ එහි ආරක්ෂාවට පවතින බාධාවන් සම්බන්ධව **1993** අංක **50** දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත අනුව අවශ්‍ය කටයුතු සිදු කිරීම. ඒ සම්බන්ධව සංක්ෂිප්ත වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට මාස **01** ක් තුළ ඉදිරිපත් කිරීම.<br><br><u>ගණන්දීමේ නිලධාරියාට සහ අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (නීති) වෙත;</u> | කාරක සභා නිර්දේශ මත හැරණියාවක ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට ස්වාධීන කමිටුවක් පත්කොට ඇති බැවින් එම කමිටු නිර්දේශ ලැබුණු පසු අධිකාරිය වෙත රාජ්‍ය භාගය තබා ගනිමින් ව්‍යාපෘතිය සිදු කිරීම සම්බන්ධව පවතින නෛතික ප්‍රතිපාදනද නිසි පැහැදිලි කිරීමක් සිදු කර ගැනීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ඉදිරි පියවර සම්බන්ධයෙන් කටයුතු කිරීමට නියමිතව ඇත.<br><br>මේ සම්බන්ධ සවිස්තරාත්මක වාර්තාවක් **2025.07.23** දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත. **(ඇමුණුම 33)** |
| | | **V.** අධිකාරිය විසින් බලපත්‍ර ප්‍රදානය කිරීමට පෙර, ගිවිසුමකට එළැඹීමට පෙර , මිල ගණන් කැඳවීමට පෙර, පුවත්පත් දැන්වීම් සිදු කිරීමට පෙර අදාළ බලපත්‍ර, දැන්වීම්, ගිවිසුම් කෙටුම්පත් අධිකාරියේ නීති අංශයට යොමු කර ඒවායේ නීත්‍යානුකූලභාවය පරීක්ෂා කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැකසීමත්, අදාළ වගකිව යුතු | අධිකාරිය විසින් බලපත්‍ර ප්‍රදානය කිරීමට පෙර, ගිවිසුමකට එළඹීමට පෙර, මිල ගණන් කැඳවීමට පෙර, පුවත්පත් දැන්වීම් සිදු කිරීමට පෙර කටයුතු කල යුතු ආකාරය සම්බන්ධයෙන් අභ්‍යන්තර චක්‍රලේඛයක් සකස් කර ඇති අතර අදාල චක්‍රලේඛය මඟින් ඒ සඳහා වගකිවයුතු නිලධාරීන් නම් කිරීමටත් රාජකාරී පැවරීමටත් සහ අදාල ක්‍රියාවලිය අඛණ්ඩව වාර්තා තබා ගැනීම සඳහා ආකෘතිපත්‍රයක් සකස් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | | නිලධාරීන්ට එම රාජකාරී පැවරීම, එම කටයුතු විධිමත්ව සිදු කිරීම, ඒ සම්බන්ධව උපදෙස් ලබා දීම සහ අදාළ ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ ඒ සම්බන්ධව නිසි ආකෘතියකින් වාර්තා තබා ගැනීම.<br><br>VI. එම සකස් කරන ලද නිසි ක්‍රමවේදය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට මාස 01 ක් තුළ ඉදිරිපත් කිරීම. එහි අඛණ්ඩ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වාර්ෂිකව විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට දැනුම් දීම. | මේ සම්බන්ධ වාර්තාවක් 2025.07.23 දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත. (ඇමුණුම 34) |
| 19 | 24 | <u>2024.07.18 වන දින පැරඩයිස් වැවේ ඉඩම් වෙන්දේසිය අවලංගු කිරීම</u><br><u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට:</u><br><br>I. මෙම මැණික් ඉඩම් වෙන්දේසිය නැවත්වීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් පවතීද යන්න සම්බන්ධයෙන් සොයා බලා එය කාරක සභාවට සහ විගණකාධිපතිවරයාට මාස 01 ක් තුළ ඉදිරිපත් කිරීම. | අදාල කරුණ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් ලැබී නොමැති බව 2025.05.23 දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව දැනුම් දී ඇත (ඇමුණුම 35) |
| 20 | 25 | <u>නීති විරෝධී මැණික් ගැරීම වැළැක්වීම</u><br><u>ගණන්දීමේ නිලධාරියාට:</u><br><br>I. අනවසර මැණික් ගැරීම් සහ නිකුත් කර ඇති බලපත්‍රවල කොන්දේසි කඩ කිරීම් සම්බන්ධව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ | අනවසර මැණික් ගැරීම් පාලනය කිරීම සහ බලපත්‍ර කොන්දේසීන්ට අනුකූලව පතල් කැණීම් සිදුවන්නේද යන්න නියාමනය කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් වැටලීම් කණ්ඩායම් ක්‍රියාත්මක කර ඇති අතර මෙම ක්‍රමවේදය ශක්තිමත් කිරීම සඳහා යෝජනා |

| | | | |
|---|---|---|---|
| | | බලාත්මක කිරීමේ අංශ ශක්තිමත් කිරීමට අවශ්‍ය සියලු කටයුතු සිදු කිරීම සහ ඒ සම්බන්ධයෙන් සංක්ෂිප්ත වාර්තාවක් මාස **01** ක් තුළ විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම. | ඇතුළත් වාර්තාවක් **2025.07.23** දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත. (ඇමුණුම **36**) |
| **21** | **26** | <u>ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට ගොඩනැගිල්ලක් කුලියට ගැනීම</u><br><u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහ ගණන්දීමේ නිලධාරිට;</u><br><br>**I.** සියලුම රාජ්‍ය ආයතන කුලී පදනමින් පවත්වා ගෙන ගොඩනැගිලිවලින් ඉවත් කර රජයේ ගොඩනැගිලිවල ස්ථාපනය කිරීමට පවතින රජය විසින් ගෙන ඇති තීරණය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.<br><br>**II.** හැකි ඉක්මනින් පැරණි ගොඩනැගිල්ලේ පිළිසකර කිරීම් සිදු කර නැවත එම ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට අවශ්‍ය සියලු කටයුතු සිදු කිරීම සහ ඒ සඳහා කාල රාමුවක් සකසා ගැනීම.<br><br>**III.** අදාළ හෝටල් ව්‍යාපෘතියෙන් ගෙවීමට එකඟ වූ මසකට රුපියල් මිලියන **03** ක මුදල ලබා ගැනීමට කටයුතු සිදු කිරීම.<br><br>**IV.** ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පැරණි ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින්ම **2025.08.31** දින දැනට කාර්යාලය පවතින ගොඩනැගිල්ලට අදාළ කුලී ගිවිසුම් අවසන් වීමට ප්‍රථම පවතින සියලු තත්ත්ව | සියලුම රාජ්‍ය ආයතන කුලී පදනමින් පවත්වා ගෙන යන ගොඩනැගිලිවලින් ඉවත් කර රජයේ ගොඩනැගිලිවල ස්ථාපනය කිරීමට අවධානය යොමු කරමින් රජයේ ආයතනයක් වන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත **2025.11.30** හෝ ඊට පෙර විතැන් කිරීමට අපේක්ෂා කර ඇත. මේ සම්බන්ධයෙන් වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් මේ වන විට ලබා ගැනීමට කටයුතු කර ඇත.<br><br>මේ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට නියමිතය. |

| | | | |
|---|---|---|---|
| | | සම්බන්ධයෙන් සලකා බලා (පැරණි ගොඩනැගිල්ලේ කාර්යාලය ස්ථාපනය කළ හැකි දිනය, නව ගොඩනැගිල්ලක් සෙවීමට යන කාලය, පිරිවැය, කාර්යාලීය උපකරණ, පරීක්ෂණගාර උපාංග රැගෙන යාමට වැය වන පිරිවැය,........) වඩාත්ම සුදුසු තීරණයක් කඩිනමින් ගැනීම.<br><br>V. මෙලෙස විශාල අනර්ථකාරී වියදමක් සිදු කිරීමට අවශ්‍ය වටපිටාව නිර්මාණය කළ, වගකිව යුතු සියලුම නිලධාරීන්ට එරෙහිව නිසි විනය ක්‍රියාමාර්ග ගැනීම.<br><br>VI. මෙම සියලු නිර්දේශ ඉටු කර ඒ පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට මාස 01 ක් තුළ ඉදිරිපත් කිරීම. | <br><br><br><br>මේ සඳහා වගකිව යුතු නිලධාරීන් නිශ්චය කර ගැනීම සඳහා මූලික පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු ආරම්භ කර ඇත. (ඇමුණුම 37)<br><br>මේ සම්බන්ධයෙන් අදාල වාර්තාව 2025.07.23 දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත. (ඇමුණුම 38) |
| **22** | **28** | <u>තායිලන්ත සංචාරය</u><br><u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරිට;</u><br><br>I. මෙම සංචාරයට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය කාරක සභාවට සහ විගණකාධිපතිවරයාට සති 02 ක් තුළ ඉදිරිපත් කිරීම. | <br><br><br>මේ සම්බන්ධයෙන් අදාල වාර්තාව 2025.07.23 දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත. (ඇමුණුම 39) |

| | | | |
|---|---|---|---|
| 23 | 31 | <u>සාකච්ඡා කිරීමට සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට නොහැකි වූ කරුණු</u><br><u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරිට;</u><br><br>I. 2023 වර්ෂය සඳහා විගණකාධිපති විසින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති 2025.03.05 වැනි දින සහ 2025.03.27 වන දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සාකච්ඡා කර වෙන් වෙන් වශයෙන් නිර්දේශ ඉදිරිපත් නොකළ සියලුම විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් අවධානය යොමු කර එක් එක් කරුණු සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඒ පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම. | 2025.03.05 වැනි දින සහ 2025.03.27 වන දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සාකච්ඡා කර වෙන් වෙන් වශයෙන් නිර්දේශ ඉදිරිපත් නොකළ සියලුම විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් වාර්තාව 2025.07.14 දිනැතිව විගණකාධිපති වෙත පිටපත් සහිතව කාරක සභාව වෙත යොමු කර ඇත. (ඇමුණුම 40) |

2025/07/28

නවීන් සූරියආරච්චි
**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි**
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

නවීන් සූරියආරච්චි
සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
[illegible]
[illegible]

ජේ.එම්.තිලකා ජයසුන්දර
**ලේකම්**
**කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**

ජේ.එම්. තිලකා ජයසුන්දර
ලේකම්
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව
සංවර්ධන අමාත්‍යාංශය
73/1, ගාලු පාර, කොළඹ 03.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපති විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස අවශ්‍ය උපදෙස් ලබා දී ඇත .

2025/07/28

ජේ. එම්.තිලකා ජයසුන්දර
ලේකම්
කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

73/1, ගාලු පාර, කොළඹ 03.

<u>ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග</u>

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත ලබාදී ඇති නිර්දේශ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩු නිවැරදි කර ගැනීමට සහ නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම් සහ ආයතනයේ සභාපති වෙත උපදෙස් ලබා දී ඇති අතර ක්‍රියාමාර්ග 2025 වර්ෂය තුළදී ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

2025/7/28

සුනිල් හඳුන්නෙත්ති ( පා. ම.)
ගරු අමාත්‍ය
කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය.

සුනිල් හඳුන්නෙත්ති (පා.ම)